IX

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# බස්නාහිර පළාතේ පළාත් සභාව

(බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලය සහ නීතිය හා සාමය මුදල් හා ක්‍රම සම්පාදන, සෞඛ්‍ය, පළාත් පාලන සහ ඉඩම් අමාත්‍යාංශය)

## බස්නාහිර පළාතේ පළාත් සභාවේ
## 1991 අංක 04 දරණ පළාත් පාලන ආයතනවල
## පරිපාලනය
## අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තිය

(බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සටහන් කළේ
1991.06.17 දින)

බස්නාහිර පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, සෞඛ්‍ය, පළාත් පාලන සහ ඉඩම් අමාත්‍යාංශයෙන් මිල දී ගත හැක.

මිල රු. රු: 10/-

තැපැල් ගාස්තුව රු.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# බස්නාහිර පළාතේ
# පළාත් සභාව

(බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය කාර්යාලය සහ නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, සෞඛ්‍ය, පළාත් පාලන සහ ඉඩම් අමාත්‍යාංශය)

## බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරණ පළාත් ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තිය

මෙම ප්‍රඥප්තිය 1991. 05. 29 වන දින පැවැත්වූ බස්නාහිර පළාත් සභා රැස්වීමේ දී සභා සම්මත වූ බව සහතික කරමි.

**සභාපති**

**බස්නාහිර පළාත් සභාව**

## 1991 අංක 04 දරණ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තිය

බස්නාහිර පළාත තුළ පිහිටුවා ඇති පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීම සඳහා, වූ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහ ඊට අදාල හෝ අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය, මහ නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරිය වූ) XIV වන කොටසේ 277 වගන්තියට, නගර සභා ආඥා පනතේ (255 වන අධිකාරිය වූ) 8 වන කොටසේ 184 වන වගන්තියට සහ 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 185 වගන්තියට අනනුකූල වූවකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ. :-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. මේ ප්‍රඥප්තිය "බස්නාහිර පළාත් සභාවේ (පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලතල පවරා දීම) 1991 අංක 04 දරණ ප්‍රඥප්තිය " යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට එය ක්‍රියාත්මක වන්නේ ය.

අකාර්යක්ෂමතාව මත පළාත් පාලන ආයතන විසුරුවා හැරීමට අමාත්‍යවරයා සතු බලය.

2. (1) යම් පළාත් පාලන ආයතනයක් හෝ යම් පළාත් පාලන ආයතනයක යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියා හෝ විසින් -

(අ) අකාර්යක්ෂම ලෙස සහ අයථා ලෙස පාලනය ගෙන ගොස් ඇති බවට; හෝ

(ආ) අදාල නීතිය, ප්‍රඥප්තිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පවරා ඇති කාර්ය ඉටුකිරීම දිගින් දිගටම පැහැර හැර ඇති බවට, හෝ

(ඇ) නීතියේ හෝ ප්‍රඥප්තිවල යම් විධිවිධානයකට අනුකූලව ක්‍රියා කිරීම දිගින් දිගටම පැහැර හැර හෝ නොසලකා හැර ඇති බවට; හෝ

(ඈ) අදාල නීතිය, ප්‍රඥප්තිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පවරා ඇති බලතල අයථා ලෙස ක්‍රියාත්මක කොට ඇති බව, හෝ

(ඉ) රුස්වීම් පැවැත්වීම හෝ රුස්වීම්වලට පැමිණීම හෝ ඒ රුස්වීම් වලදී ඡන්දය පාවිච්චි කිරීම හෝ ඒ රුස්වීම්වල කටයුතු කරගෙන යාම දිගින් දිගටම පැහැර හැර ඇති බවට;

බස්නාහිර පළාතේ පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලයේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා සෑහීමට පත්වන කවර වූව ද අවස්ථාවක දී, ඒ එක් එක් අවස්ථාවට අනුකූලව අවශ්‍ය වන පරිදි, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් -

(i) ඒ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා ධූරයෙන් ඉවත්කරනු ලැබිය හැකිය., නැතහොත්

(ii) ඒ පළාත් පාලන ආයතනයේ සියළුම සාමාජිකයන් හෝ සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකිය, නැතහොත්

(iii) ඒ පළාත් පාලන ආයතනය විසුරුවා හැරිය හැකිය.

එවැනි නියමයක් පහසුතාක් ඉක්මණින් පළාත් සභාව වෙත තැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් (1) (i) හෝ (ii) හෝ (iii) වන උප වගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර, එකී (1) වන උප වගන්තියේ සඳහන් කරුණු සම්බන්ධයෙන් තමා සෑහීමට පත්වීම සඳහා; එකී කරුණු ගැන පරීක්ෂා කර මාස තුනක් ඇතුලතදී ඒ පිළිබඳ වාර්තාවක් සැපයීමට, විශ්‍රාමික අධිකරණ නිලධරයකු පත්කළ යුතු ය. එසේ පත් කරනු ලැබූ තැනැත්තාට, ඒ පරීක්ෂණය සම්බන්ධයෙන්, පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරනු ලැබූ කොමසාරිස්වරයකු සතු බලතල හිමි වේ.

"(3) (අ) යම් කරුණක් පිළිබඳව (2) උප වගන්තිය යටතේ පරීක්ෂණයක් කිරීමට විශ්‍රාම ලත් විනිශ්චයකරුවකු පත් කිරීමට පෙරාතුව ක්‍රියාවලිය නැවැත්වීමක් වශයෙන් වූ කරුණු විමසීමකින් හෝ වෙනත් සම්ප්‍රදායකින් තොරව අදාළ නිලධාරියා විසින් යෝජිත පරීක්ෂණයට හෝ වාර්තා කිරීමට යටත්ව අමාත්‍යවරයා විසින් මූලිකව"

(i) ඒ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාගේ වැඩ අත්හිටුවිය යුතු අතර, ඔහුගේ ධූරයේ කටයුතු කිරීමට අවස්ථාවෝචිත පරිදි, ඒ පළාත් පාලන ආයතනයේ නියෝජ්‍ය නගරාධිපතිවරයාට හෝ උප සභාපතිවරයාට විධාන කළ යුතු අතර, ඒ පළාත් පාලන ආයතනයේ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ නැතහොත් උප සභාපතිවරයාගේ ධූරය පුරප්පාඩු වී හෝ ඒ නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ හෝ උප සභාපතිවරයාගේ වැඩ අත්හිටුවා ඇති අවස්ථාවක දී, යට කී ප්‍රධාන විධායක නිලධාරියාගේ බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්යය ඉටු කිරීමට

නාගරික කොමසාරිස් වරයාට හෝ තත් ප්‍රදේශයේ සහකාර පළාත් පාලන කොමසාරිස් වරයාට විධාන කළ යුතු ය. නැතහොත්,

(ii) ඒ පළාත් පාලන ආයතනයේ යම් සභිකයකුගේ ධූරය අත්හිටුවිය හැකිය, නැතහොත්, -

(iii) ඒ පළාත් පාලන ආයතනයේ කටයුතු අත්හිටුවිය හැකි අතර, ඒ පළාත් පාලන ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමට සහ කාර්යය ඉටුකිරීමට, අවස්ථාවෝචිත පරිදි, නාගරික කොමසාරිස් වරයාට හෝ තත් ප්‍රදේශයේ සහකාර පළාත් පාලන කොමසාරිස් වරයාට විධාන කළ හැකි ය.

(ආ) මේ වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තාගේ වාර්තාව තමා වෙත ලැබුණුවිට, අමාත්‍යවරයා විසින්, මේ වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ නියමයක් කිරීම හෝ මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරනු ලැබූ නියමයන් අවලංගු කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(4) විසුරුවා හරිනු ලැබූ මහ නගර සභාව වෙනුවට, මහ නගර සභා ආඥා පනතේ විධිවිධාන වලට අනුකූලව අළුත් මහ නගර සභාවක් සංස්ථාපනය කරන ලෙසත්, විසුරුවා හරිනු ලැබූ පළාත් පාලන ආයතනය වෙනුවට විසුරුවා හරිනු ලැබූ පළාත් පාලන ආයතනයක් අදාල නීතියේ විධි විධාන වලට අනුකූලව, අළුත් පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය කරන ලෙසත්, ඉහත සඳහන් ආකාරයට ම පළ කරනු ලබන තදනන්තර නියමයක් මගින් අමාත්‍යවරයා විසින් විධාන කරනු ලැබිය හැකිය.

(5) මේ වගන්තිය යටතේ කරනු ලබන සෑම නියාමයකම, ඒ නියමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන විධාන ඇතුළත් විය යුතු අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට, ප්‍රඥප්තියක බලය ඊට ඇත්තේ ය.

(6) මහ නගර සභාවක් හෝ පළාත්පාලන ආයතනයක් විසුරුවා හැරීමෙන් පසු, ඒ මහ නගර සභාව හෝ පළාත් පාලන ආයතනය වෙනුවට අළුත් මහ නගර සභාවක් හෝ අළුත් පළාත් පාලන ආයතනයක් සංස්ථාපනය කරනු ලැබූ විට, ඒ අළුත් මහ නගර සභාව හෝ පළාත් පාලන ආයතනය, එය සංස්ථාපනය කිරීමට පෙරාතුවම මහ නගර සභා ආඥා පනත යටතේ විසුරුවා හරිනු ලැබූ ඒ මහ නගර සභාව වෙත හෝ අදාල නීතිය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ඒ පළාත් පාලන ආයතනය වෙත පවරා දී හෝ පනවා හෝ භාර කොට තිබුණු අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල කාර්යසහ කර්තව්‍ය පාවිච්චි කළ, ඉටුකළ හෝ ක්‍රියාත්මක කළ තැනැත්තාගේ හෝ තැනැත්තන්ගේ අනුප්‍රාප්තිකයා වන්නේ ය.

**අර්ථ නිරූපණය**

3. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, "පළාත් පාලන ආයතනය" යන්නෙන්, බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වන යම් " මහ නගර සභාවක් " " නගර සභාවක්" හෝ "ප්‍රාදේශීය සභාවක් " අදහස් වේ. "ප්‍රධාන විධායක නිලධාරියා" යන්නෙන්, "මහ නගර සභාවක නගරාධිපතිවරයා" හෝ නගර සභාවක නැතහොත් ප්‍රාදේශීය සභාවක "සභාපති වරයා" අදහස් වේ. "අදාල නීතිය" යන්නෙන්, මහ නගර සභා ආඥා පනත හෝ නගර සභා ආඥා පනත හෝ ප්‍රාදේශීය සභා පනත අවස්ථාවෝචිත පරිදි අදාල වේ.

**අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.



සනොස ප්‍රින්ටර්ස් ලිමිටඩ්, 290, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10.